---

**කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව.**

**මාතර දිස්ත්‍රික්කය.**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 07 දිනද, ඉකත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 ජුනි 14 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 සැප්තැම්බර් 25 දින සභාවේ සභාපතිවරයාවෙත යවා ඇත.

1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් ඉදිකරන ලද පුස්තකාල ගොඩනැගිල්ලේ වටිනාකම රු.3,458,000 ක් වුවද මූල්‍ය ප්‍රකාශන වල රු.502,000 ක් ලෙසට දක්වා තිබුණෙන් රු.2,956,000 කින් ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල මෝටර් රථ, කරත්ත යටතේ ඉදිරියට ගෙනා වටිනාකම රු.4,785,810 ක් ලෙස දක්වා තිබුණද ප්‍රධාන ලෙජරය අනුව ඉදිරියට ගෙනා වටිනාකම රු.3,172,605 ක් වූයෙන් වත්කමේ වටිනාකම රු.1,613,205 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ජර්නල් සටහන් අංක 04 මගින් හිඟහිටි බදුකුලී ලැබීම් රු.7,295,727 ක මුදලක් හර කර තිබුණද පොදු ලෙජරයේ රු.1,205,727 ක් ලෙසට සටහන් කර තිබුණෙන් වෙනස රු.6,090,000 ක් විය.

(ඈ) පොදු ගබඩා ගිණුමේ වර්ෂය තුල මිළදී ගැනීම් හා නිකුත් කිරීම් සටහන් නොකොට පසුගිය වර්ෂයේ ආරම්භක වටිනාකමට අවසාන වටිනාකම එකතු කර දක්වා තිබූ අතර විදුලිය ගබඩා ගිණුමේ වර්ෂය තුල මිළදී ගැනීම හා නිකුත් කිරීම් සටහන් නොකොට වර්ෂය ආරම්භක වටිනාකමට වර්ෂය අවසාන වටිනාකම එකතු කර දක්වා තිබුණි. මේ අනුව තොග නිකුත් කිරීමේදී (FIFO) පළමු ලැබීම පළමු නකුත් කිරීම් ක්‍රමය භාවිතා කර නොමැති බවද නිරීක්ෂණය විය.

(ඉ) ශේෂ පිරික්සුම පිළියෙල කිරීමේදී වර්ෂයේ සියළුම වත්කම්, වගකීම්, ආදායම්, වියදම් ශේෂ සියල්ලම ඇතුළත් විය යුතු වුවද සභාව විසින් පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම තුල රු.13,315,407 ක් වූ ආදායම් හා රු.13,921,860 ක් වූ වියදම් සටහන් කර නොතිබුණි.

(ඊ) සමාලොචිත වර්ෂයේ ගිණුම් විෂයයන් 10 කට අදාල පාලන ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.3,924,440 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂයන්ගේ එකතුව රු.4,973,159 ක් වූයෙන් වෙනස රු.1,048,719 ක් විය.

(උ) 2012 දෙසැම්බර් 31 දිනට වසරක කාලයක් ඉක්මවා තිබුණු ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂයන්හි එකතුව පිළිවෙලින් රු.16,272 ක් හා රු.80,892,641 ක් විය.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.115,343,241 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.606,453 ක් වූ අතර, එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 250,857 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (i) | වරිපනම් බදු | 235 | 176 | 51 |
| (ii) | බදු කුලී | 1,296 | 1,206 | 90 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 372 | 201 | 171 |

### 2.3 අවිධිමත් ගනුදෙනු

(අ) දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ 2005 ඔක්තෝබර් 05 දිනැති අංක 1413/15 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ පළ කරනලද රීතිමාලාවේ 3 රීතිය (1) (1) පරිදි දීමනා ගෙවීමේදී වෛද්‍ය වාර්තා ඉදිරිපත් කිරීමෙන් හෝ විධිමත් පරිදි නිවාඩු ලබා ගැනීමකින් තොරව පවත්වන ලද සභා රැස්වීම් සහ කාරක සභා රැස්වීම් වලට සහභාගී වී නොමැති මන්ත්‍රීවරු තිදෙනෙකු වෙත 2012 වර්ෂයේදී සභික දීමනා ලෙසට රු.81,000 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) දකුණු පළාත් සභාවේ මහා මාර්ග අමාත්‍යාංශයට අයත් අංක SP HF - 2440 දරන ඩබල් කැබ් රථය 2012 මැයි 20 දින සිට සභාපතිවරයාගේ රාජකාරි ගමන් සඳහා යොදවා ගෙන තිබුණි. මෙම වාහනය සඳහා සභා අරමුදලින් 2012 මැයි 20 සිට 2012 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුල රු.434,903 ක් වටිනා ඉන්ධන ලීටර් 3735.2 ක්ද අළුත්වැඩියා වියදම සඳහා රු.71,606 ක්ද වැයකර තිබුණද එකී වියදම් සඳහා සභා අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ඇ) සභාවේ සභාපතිවරයා කිරින්ද පුහුල්වැල්ල ගොවිජන සේවා කාරක සභාවේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරියෙකු ලෙස සේවය කරන අතර රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 2008 ජනවාරි 10 දිනැති අංක 32/91(iii) දරන චක්‍රලේඛය පරිදි සභාවේ කටයුතු සඳහා මසකට දින 07 ක නිවාඩු ලබාගෙන ඉතිරි දිනවල නිලධාරියාට අයත් නිත්‍ය තනතුරේ සේවයේ යෙදීමට ගොවිජන සේවා කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබාගෙන තිබුණි.

සභාපතිවරයා ගොවිජන සේවා කාරක සභාව වෙත ඉදිරිපත් කර තිබූ ඉදිරි වැඩ සටහන හා කළ වැඩ වාර්තා අනුව කාරක සභාවේ විවිධ කාර්යයන් හි යෙදුන බව දක්වා ඇතත් එක දිනවල සභාවේ කටයුතු වල යෙදුන බව දක්වමින් සාවද්‍ය ලෙස රු.22,000 ක සංයුක්ත දීමනා ලබාගෙන ඇති බව නිරීක්ෂණය විය.

(ඈ) 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රදේශීය සභාවේ කටයුතු පවත්වාගෙන යාමේදී ප්‍රසම්පාදන කමිටුවක් පත්කර ක්‍රියාත්මක කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ සිදුකරන ලද රු.317,254 ක් වටිනා මිළදී ගැනීම් සඳහා කිසිදු ප්‍රසම්පාදන කමිටු තීරණයක් ගෙන නොතිබුණි.

2.4 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන කොමසාරිස් වෙතින් කාර්යය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා ලෙස රු.7,215,382 ක මුදලක් ප්‍රතිපූර්ණය කර ගෙන තිබූ අතර වර්ෂයේ වැටුප් වියදම රු.10,244,915 ක වූයෙන් සභා අරමුදලට රු.3,029,533 ක අතිරේක වැය බරක් ඇති වී තිබුණි.

(ආ) දේශීය අදායම් කොමසාරිස් ජනරාල්ගේ 2002 සැප්තැම්බර් 16 දිනැති එකතු කළ අගය මත බද්ද චක්‍රලේඛ අංක 02 හි 05 ඡේදය පරිදි අය කළ බද්ද පළාත් පාලන ආයතනයේ ආදායමක් නොව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ගෙවිය යුතු ව්‍යවස්ථාපිත අය කිරීමක් වන අතර, අයකරන ආයතනය නීතිමය භාරකරුවෙකු පමණක් වුවද සභාව විසින් අයකර තිබුණු රු.876,491 ක මුදල දේශීය ආදායම් කොමසාරිස්ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ඇ) 1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ පනත පරිදි ප්‍රාදේශීය සභාවේ සභාපති, උප සභාපති ඇතුළු මන්ත්‍රීවරුන් හයදෙනෙකු විසින් 2012 වර්ෂය සඳහා වත්කම් බැරකම් ප්‍රකාශ 2013 ජුනි 28දින දක්වාම ලබාදී නොතිබුණි.

2.5 අංක LE - 7478 දරන කැබ් රථය

ප්‍රාදේශීය සභාවේ අංක LE - 7478 දරන කැබ් රථය පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් 2008 ජනවාරි 10 දින ලැබී තිබුණ අතර 2012 මාර්තු 06 දින දක්වා සභාවේ කටයුතු සඳහා ධාවනයේ යොදවා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2008 ජනවාරි 10 දින සිට 2012 මාර්තු 06 උන දක්වා වර්ෂ 4 කුත් මාස 02 ක කාලය තුල වාහනය කිලෝ මීටර් 161,450 ක දුර ධාවනය කර තිබුණු අතර වර්ෂ 5කටත් අඩු කාලයකදී එය අක්‍රිය වී තිබුණි. එය සභා භූමියෙන් පිටස්තර ස්ථානයක වර්ෂයකට අධික කාලයක් ධාවනයෙන් තොරව ගාල්කර තිබීම හේතුවෙන් එය සම්පූර්ණයෙන්ම දිරාපත්ව තිබූ බව 2013 ජුනි 04 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ආ) මෙම වාහනයට අදාල මෙහෙයුම් අත්පොත අනුව කි.මී. 4000 සිට කි.මී. 100,000 දක්වා අවස්ථා 17 ක් සේවා කිරීම් විකුණුම් ආයතනය මගින් කළ යුතුව තිබුණද 2008 ජුනි 26 දින කි.මී. 16,000 දී සේවා කිරීමෙන් පසු නියමිත සේවා කිරීම් සිදු නොකර ධාවනයේ යොදවා තිබුණි. මේ හේතුව නිසා වර්ෂ 4ක පමණ කෙටි කාලයකදී ධාවන කළ නොහැකි තත්ත්වයට පත්ව තිබුණි. මෙම වාහනය අක්‍රියවී ඇති බව සභා ලේකම්වරයා ප්‍රකාශ කළද එය ධාවනය කළ නොහැකි බවට රියදුරු විසින් හෝ යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ තත්ත්ව පරීක්ෂණ සහතිකයකින් හෝ සනාථ කර නොතිබුණි. කෙසේ වුවද මාතර මෝටර් රථ පරීක්ෂකවරයා විසින් වාහනය සඳහා 2012 ජනවාරි 9 සිට 2013 ජනවාරි 8 දින දක්වා කාල පරිච්ඡේදය වෙනුවෙන් යෝග්‍යතා සහතිකයක්ද නිකුත් කර තිබුණි.

(ඇ) මෙම වාහනය අළුත්වැඩියා කිරීම සඳහා සභාවට මුල්‍යමය හැකියාවක් නොමැති හෙයින් දකුණු පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් අනුමැතිය හා එහි තක්සේරු වටිනාකම ලබාගෙන ලංසු කැඳවීමට 2012 සැප්තැම්බර් 28 දිනැති මහා සභාවෙන් තීරණය කර ඇතත් එම අනුමැතිය 2013 ජුනි 04 දින දක්වාම ලැබී නොතිබුණි.

(ඈ) සභාවේ තාක්ෂණික හෝ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියක් රහිතව මෙම වාහනය සඳහා 2009 ජනවාරි 01 දින සිට 2011 නොවැම්බර් 07 දින දක්වා වර්ෂ තුනක කාල පරිච්ඡේදය තුල රු.232,930 ක් අළුත්වැඩියා කටයුතු සඳහා වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 178 කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

(ඉ) 2010 මාර්තු 10 දිනැති අංක PF/R/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය ප්‍රකාර සභාවේ දර්ශනය හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා වර්ෂ 03 කට නොඅඩු කාලයක් සඳහා ක්‍රියාකාර සැලැස්මක් පළියෙල කර නොතිබුණි.

2.6 අභ්‍යන්තර විගණනය

සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබු අතර විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කර නොතිබුණි.

---

3. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාපතිවරයාගේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය